# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# උපකුලපති තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34(1) වගන්තියේ සහ එහි පසුකාලීන සංශෝධනවල හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 03/2023 දරන චක්‍රලේඛයෙහි නියමයක් ප්‍රකාරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් උපකුලපති තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1978 අක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ උපකුලපතිවරයා, විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියෙක් වන අතර, ඔහු / ඇය එහි ප්‍රධාන විධායක නිලධාරියා ද, අධ්‍යයන ප්‍රධානියා ද, සහ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ද වේ. ඔහු / ඇය නිල බලයෙන් පාලක සභාවේ සහ සනාතන සභාවේ සාමාජිකයෙක් හා සභාපති ද වේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව, උපකුලපතිවරයා ඔහු / ඇය ධුර කාලය අවසන් වීමට පෙර, ධුරයෙන් ඉවත් වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හැර, වසර තුනක කාලයක් සඳහා එම තනතුර දරනු ලබන අතර, ඔහු / ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු හෝ උපකුලපති තනතුරේ කාලය අවසන් වනතුරු හෝ යන දෙකෙන් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළ යුතු වේ.

අධ්‍යයන කටයුතු මෙහෙය වීම, කළමනාකරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම හා මෙහෙයවීම, පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම හා විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් උපකුලපතිවරයා වගකිව යුතු වේ. ඔහු / ඇය අධ්‍යයන විශිෂ්ටත්වය, පාරදෘශ්‍ය භාවය. වගවීම ප්‍රජාතාන්ත්‍රික කළමනාකරණය හා සඵල අපක්ෂපාතී නායකත්ව මූලධර්ම පිළිපැදිය යුතුයි.

තෝරාගනු ලබන අපේක්ෂකයා. ඉහළ අධ්‍යයන ඉලක්ක සපුරාගත් සහ සාර්ථක පර්යේෂණ දර්ශකයන් සහිත නායකත්ව ලක්ෂණයන්ගෙන් හෙබි. විවිධ පුද්ගල පාර්ශ්වයන් සමඟ ප්‍රශස්ත අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වාගත හැකි, ප්‍රතිපත්තිමය ගැටලු සම්බන්ධ මනා අවබෝධයක් ඇති, තීරණ ඵලදායි ලෙස ක්‍රියාත්මක කළ හැකි අයෙක් විය යුතුයි. ඔහු / ඇය සතුව ප්‍රජාව කෙරෙහි ඇති කැපවීම ඇතුළුව, විශ්වවිද්‍යාලයක ආචාරධර්ම සහ මෙහෙවර පිළිබඳ ගැඹුරු අවබෝධයක් තිබිය යුතුයි. අපේක්ෂිත අයදුම්කරුවන්, වැඩිදුර විස්තර සඳහා විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය (http://www.pdn.ac.lk) වෙත පිවිසීමට ආරාධනා කෙරේ.

උපකුලපති. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩල වැටුප් පරිමාණයේ ඉහළම වැටුප් තලයේ තැබීමට හිමිකම් ලබන අතර, අදාළ මූලික වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක්, සන්නිවේදන දීමනාවක්, ඉන්ධන දීමනාවක් ආදිය ලැබීමට සුදුසුකම් ලබයි. මීට අමතරව, නිල වාහනයක් හා උපකුලපති නිල නිවස ද හිමි වේ.

අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.

I. උපන්දිනය ද ඇතුලුව අයදුම්කරුගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක් (අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 63 ට අඩු විය යුතුය.)

II. විශ්වවිද්‍යාලයේ සංවර්ධනය උදෙසා පෞද්ගලික දැක්ම පිළිබඳ ප්‍රකාශයක් සහ අයදුම්කරු උපකුලපති තනතුරට පත්වුවහොත්, සිදුකිරීමට අපේක්ෂිත සැලැස්ම පිළිබඳ කෙටි විස්තරයක්.

   පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2042 වර්ෂය වන විට වසර 100 ක් සපිරීම නිමිත්තෙන් ඊට සමගාමීව සියවස් සංවර්ධන ව්‍යාපෘතියක් යෝජනා කර ඇත. එම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම උදෙසා අපේක්ෂිත අයදුම්කරුවන්ට යෝජනා ඉදිරිපත් කළ හැක. ඉහත ව්‍යාපෘතිය පිළිබඳ වැඩිදුර විස්තර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වැඩබලන ලේඛකාධිකාරීවරයාගෙන් ලබාගත හැකිය.

III. අයදුම්කරු දැනට උපකුලපති ධුරය හොබවන්නේ නම් හෝ මීට පෙර, මෙම විශ්වවිද්‍යාලයේ එම ධුරය හොබවා ඇත්නම්, ඉහත 02 හි සඳහන් ලියකියවිලි වලට අමතරව. ඔහු / ඇය පළමු ධුර කාලය තුළදී අත්පත්කර ගන්නා ලද ජයග්‍රහණයක් විදහාපාන වාර්තාවක්.

IV. අයදුම්කරු, රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පේරාදෙණිය විශ්වවිද්‍යාලය හැර, වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේ නම් ඔහු / ඇය තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවට සේවා යෝජකයාගෙන් ලිපියක්.

අයදුම්පත් **2024/02/07 වන දින පස්වරු 3.30 ට හෝ ඊට පෙර "වැඩබලන ලේඛකාධිකාරී / පාලක සභාවේ ලේකම්, සනාතන මන්දිරය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්** එවීම හෝ වැඩ කරන දිනයක ලේඛකාධිකාරී කාර්යාලයට පෞද්ගලිකව පැමිණ භාරදීම සිදු කල යුතුය. අයදුම්පත්‍ර බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "උපකුලපති තනතුර" ලෙස සඳහන් කළ යුතු වේ.

මෙයට අමතරව, අයදුම්පත හා අදාළ ලිපිලේඛනයන්හි මෘදු පිටපතක් PDF ආකාරයට සකස් කොට, registrar@gs.pdn.ac.lk විද්‍යුත් ලිපිනයට ඉහත සඳහන් දිනට පෙර යොමු කළ යුතුයි.

අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනෙන් පසු, මාස දෙකක් ඇතුළත වැඩ කරන දිනයක විශේෂ පාලක සභා රැස්වීමක් කැඳවනු ලබන අතර, අයදුම්කරුවන් පිරිඇගයීම සහ සම්මුඛ පරීක්ෂණය සඳහා විශේෂ පාලක සභාවට පෞද්ගලිකව කැඳවනු ලැබේ. සියලුම අපේක්ෂකයින් අවම වශයෙන් විනාඩි දහයක (10) හෝ පහළොව (15) නොඉක්මවන කාල සීමාවක කෙටි ඉදිරිපත් කිරීමක් කළ යුතු වේ. යම් අසනීප තත්වයක් / විදේශ ගත වී සිටීම හේතුවෙන් යම් අයදුම්කරුවෙකුට විශේෂ පාලක සභා රැස්වීම ඉදිරියේ භෞතිකව පෙනී සිටිය නොහැකි නම්, ලේකම්වරයාට පූර්ව දැනුම් දීමක් කිරීමෙන් පසුව ඔහුට / ඇයට වීඩියෝ තාක්ෂණය ඔස්සේ සහභාගී විය හැක.

2023/04/10 දිනැතිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 03/2023 විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛයේ දක්වා ඇති ක්‍රමවේදය අනුව තෝරා ගැනීම සිදු කෙරේ. උපකුලපති තනතුරට පත් කිරීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ වැඩිදුර විස්තර සඳහා, කරුණාකර ඉහත සඳහන් කරන ලද චක්‍රලේඛය වෙත යොමුවන්න.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය හා වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**වැඩබලන ලේඛකාධිකාරී සහ ලේකම් පාලක සභාව**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය.**
**2024.01.07**